සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

1130

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2014
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය தரம் Grade 09 | විෂයය பாடம் Subject නර්තනය (දේශීය) | පත්‍රය வினாத்தாள் Paper I, II | කාලය காலம் Time පැය 1½ |

නම :- ........................ විභාග අංකය :- ........................

සැලකිය යුතුයි:

- I කොටසේ I සිට 10 දක්වා සියලුම ප්‍රශ්නවලටත් එයට අමතරව II උඩරට නර්තනය හෝ III පහත රට නර්තනය හෝ IV සබරගමු නර්තනය යන කොටස් තුනෙන් ඔබ හදාරන කොටස තෝරා පිළිතුරු සපයන්න.

## I කොටස

- අංක 01 සිට 10 දක්වා ප්‍රශ්නවලට හිස්තැනට සුදුසු වචනය පහත පිළිතුරු කොටුවෙන් තෝරා ලියන්න.

(01) ශාරීරික නම්‍යතාවය හා කායික වර්ධනය ඇති කර ගැනීම සඳහා ........................ අභ්‍යාස කිරීම නර්තනයේ දී වැදගත් වේ.

(02) නර්තන නිර්මාණයේ දී අවකාශය පොදු හා ........................ වශයෙන් කොටස් දෙකකට බෙදේ.

(03) අංග, ප්‍රත්‍යංග, උපාංගයන් ගෙන් අදහස් ප්‍රකාශ කිරීම ........................ අභිනය ලෙස හඳුන්වයි.

(04) " එනවා ඇඳුරෝ තරඟෙට කීම කියා ගෙන". මෙම කවිය ........................ නැටුම සඳහා භාවිතා කරයි.

(05) සමූහ වාදනයකදී සාම්ප්‍රදායික භාණ්ඩ මෙන්ම ........................ භාණ්ඩ වලින් නිර්මාණාත්මක පද වාදනය කළ හැකිය.

| | | | |
|---|---|---|---|
| සවරම් | ආදේශ | ජිම්නාස්ටික් | තාලම්, |
| සාත්වික | | දඬුබෙර | |
| පාසරඹ | වට්ටම් | පුද්ගල | ආංගික |

- ප්‍රශ්න අංක 06 සඳහා පහත දැක්වෙන රූප සටහන ඇසුරු කර ගෙන නිවැරදි පිළිතුර තෝරන්න.

(06) 

මෙම රූප සටහනින් දැක්වෙන්නේ,

(1) යාපහුවේ භරත නාට්‍ය විලාසයයි.
(2) කුට්ටම් පොකුණේ අඩි තාලමේ නළඟන රූපයයි.
(3) ලෝවාමහාපායේ කණු හිස්වල නර්තන විලාසයයි.
(4) අංක 02 ශිව දේවාලයේ ලෝකඩ නටරාජා රූපයයි.

190

(07) සන්නිවේදන කාර්යයේදී දවුල පමණක් යොදා ගෙන කරණු ලබන වාදනය වන්නේ,
(1) වඳ බෙරය (2) යුධ බෙරය (3) අණ බෙරය (4) රණ බෙරය

(08) ලුණු පටි කණුවකට සම්බන්ධකර රවා මවමින් වට්ටේ නර්තනයේ යෙදෙන ද්‍රවිඩ ගැමි නැටුමකි.
(1) කෝලාට්ටම් (2) පින්නල් කෝලාට්ටම්
(3) කාවඩි (4) ලී කෙළි

(09) බලි ශාන්ති කර්මයේ එන ග්‍රහපන්ති ගායනා කිරීමේ දී භාවිතා කරනු ලබන්නේ,
(1) අත්මිණිය යි. (2) තාලම්පටයි (3) තලිය යි (4) සීනුවයි

(10) නර්තනයේ හා සංගීතයේ සහ සම්බන්ධතාවය රඳා පවතින්නේ,
(1) වේදිකාව සහ වාදනය මතයි (2) තාලය හා රේඛා මතයි
(3) තාලය හා අවකාශය මතයි (4) රිද්මය සහ තාලය මතයි

## II උඩරට නැටුම්

(11) " තෙයිත තෙයිත තෙයි තෙයියත් තාම් " මෙය
(1) 11 වන පා සරඹ පදය වේ (2) 10 වන පා සරඹ පදය වේ.
(3) 12 වන පා සරඹ පදය වේ. (4) 9 වන පා සරඹ පදය වේ.

(12) " සිරිවස ගෙන අසු නැගෙමින් නොලසා" මෙම කවිය ගායනා කරන්නේ,
(1) මහතනි තිතට ය. (2) සුළු තනි තිතට ය.
(3) සුළු මැදුම් දෙතිතට ය. (4) මැදුම් තනි තිතට ය.

(13) මාත්‍රා 3 + 4 තාල රූපයට අයත් අඩව්වක කොටසක් වේ.
(1) තත් තකට තක රොං.... (2) තාං දොමිති ගත දොම් කිට....
(3) තත්ත තරි තරි තතරි තරි තරි.... (4) රූංතක ජිංතක තරිකිට කුංදත්....

(14) " අන්දමකින් ඉඳ පෙනය නගායේ" මෙම කවියේ දෙවෙනි කවි පද කොටස වනුයේ,
(1) ලෝතුළ රන්දම් සිරිනි දිගායේ.... වේ. (2) සන්දම මෙන් දැහැඩින් වකලායේ.... වේ.
(3) රන්දම මෙන් ගත වටින් දිලියේ.... වේ. (4) පන්දම ලෙස දණ දී නටවායේ.... වේ.

(15) 1991 දි කැළණිය විශ්ව විද්‍යාලයේ සෞන්දර්ය අධ්‍යයන ආයතනය විසින් පිරිනමන ලද ආචාර්ය උපාධියෙන් පිදුම් ලැබූ ප්‍රවීන උඩරට නර්තන ශිල්පියෙකි.
(1) එස් පණිභාරත ගුරුතුමා (2) කේ. එස්. ප්‍රනාන්දු ගුරුතුමා
(3) පියසාර ශිල්පාධිපති ගුරුතුමා (4) නිත්තවෙල ගුණයා ගුරුතුමා

(16) උඩරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය හා ඇඳුම් කට්ටලය වනුයේ,
(1) පහතරට බෙරය - පබළු ඇඳුම් කට්ටලයයි. (2) ගැටබෙරය - තෙල්මේ ඇඳුම් කට්ටලයයි.
(3) ගැටබෙරය - වෙස් ඇඳුම් කට්ටලයයි. (4) පහතරට බෙරය - වෙස් ඇඳුම් කට්ටලයයි.

(17) "දොං ජිං ජිං තකට දොංතක" මෙම බෙර පදයට අයත් තාල රූපය වන්නේ,
(1) මාත්‍රා 2 + 3 දෙතිතේ තාල රූපයයි. (2) මාත්‍රා 3 + 4 දෙතිතේ තාල රූපයයි.
(3) මාත්‍රා 4 + 4 දෙතිතේ තාල රූපයයි. (4) මාත්‍රා 2 + 4 දෙතිතේ තාල රූපයයි.

(18) උඩරට නර්තන සම්ප්‍රදායේ වන්නමක පද නර්තනයෙන් පසු අනුපිළිවෙළින් ඉදිරිපත් කරනු ලබන්නේ,

(1) සීරුමාරුව, අඩව්ව, ඉරට්ටිය යන කොටස් වේ.
(2) සීරුමාරුව, කස්තිරම, අඩව්ව යන කොටස් වේ.
(3) කස්තිරම, කලාසම, සීරුමාරුව යන කොටස් වේ.
(4) කස්තිරම, සීරුමාරුව, අඩව්ව යන කොටස් වේ.

(19) කොහොඹා දෙවියන්ගේ උපත් කතාව ගායනය හා නර්තනය මගින් ඉදිරිපත් කෙරෙන සමූහ නර්තන අංගය වන්නේ,

(1) කොහොඹා හැල්ල වේ. (2) කුවේණි අස්න වේ.
(3) යක්තුන් පදය වේ. (4) මල් මඩු පූරය වේ.

(20) දේශීය නර්තන ගායන හා සංස්කෘතිකාංග ඇතුළත් සෞන්දර්යාත්මක වටිනාකමකින් යුත් ඇසළ පෙරහැර නම්,

(1) ගංගාරාමයේ නවම් පෙරහැරයි. (2) මහනුවර දළදා පෙරහැරයි.
(3) කැළණි විහාරයේ දුරුතු පෙරහැරයි. (4) දෙවිනුවර මිහිඳු පෙරහැරයි.

(ලකුණු 1 × 10 = 10)

## III පහතරට නැටුම්

(11) " තෙයියත් තරිකිට ගුඳිතකු දොංගත ගුහිත ගදිරිකිට තත් දිත් තා" මෙය.

(1) 11වන පා සරඹ පදයවේ. (2) 12 වන පා සරඹ පදය වේ.
(3) 10 වන පා සරඹ පදය වේ. (4) 9 වන පා සරඹ පදය වේ.

(12) " පැවිය ගණඳුරු දුරැර දිවාකර" මෙම කවිය ගායනා කරන්නේ,

(1) මැදුම් මහ දෙතිතට ය. (2) සුළු මැදුම් දෙතිතට ය.
(3) සුළු මහ දෙතිතට ය. (4) මැදුම් තනි තිතට ය.

(13) මාත්‍රා 3 + 4 තාල රූපයට අයත් ඉරට්ටියක කොටසක් වේ.

(1) දොංත ගතං ගුං දිත ගත්තත්....... (2) දොංත ගත් දෙගත ගත්......
(3) දොංත ගත්තං ගදිත ගත්තං...... (4) ගුද ගදිගත ගුද ගුද ගදිගත......

(14) " වලායටින් සඳ පායන්නාසේ වැඩ ඉඳ උඩුමාලේ" මෙම කවියේ දෙවෙනි පද කොටස වනුයේ.

(1) නිමල දහම් අපෙ සුරිය තරනිඳු.....වේ. (2) මිහිපිට රන්තරු දිලිසෙන්නා සේ....වේ.
(3) කුඩ සේසත් සමගින් සෙනගම......වේ. (4) මිහිපිට පිරිවර වට දැලේ.......වේ.

15) ගිරිදේවි නැටුම, සළුපාලිය, සුරඹාවල්ලිය වැනි නර්තන අංග ප්‍රථමයෙන් නූතන වේදිකාවට සුදුසු ලෙස සකස් කිරීමේ ගෞරවය හිමි කර ගත් පහතරට ප්‍රවීන නර්තන ශිල්පියෙකි.

(1) කේ. එස්. ප්‍රනාන්දු ගුරුතුමා (2) ඕ.එන්. එස් ප්‍රනාන්දු ගුරුතුමා
(3) සචරිස් සිල්වා ගුරුතුමා (4) විල්සන් ඔලබොඩුව ගුරුතුමා

(16) පහතරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය හා ප්‍රධාන ඇඳුම් කට්ටලය වනුයේ.

(1) උඩරට බෙරය - දෙවොල් ඇඳුම් කට්ටලය යි.
(2) පහතරට බෙරය - පත්තිනි ඇඳුම් කට්ටලය යි.
(3) පහතරට බෙරය - තෙල්මේ ඇඳුම් කට්ටලය යි.
(4) ගැටබෙරය - තෙල්මේ ඇඳුම් කට්ටලය යි.

(17) ''දොං්ත ගුදං ගත ගදිත ගතං ගුද'' මෙම බෙර පදයට අයත් තාල රූපය වන්නේ,
(1) මාත්‍රා 2+4 දෙතිතේ තාල රූපය යි. (2) මාත්‍රා 3+4 දෙතිතේ තාල රූපය යි.
(3) මාත්‍රා 2+3 දෙතිතේ තාල රූපය යි. (4) මාත්‍රා 4+4 තනි තිතේ තාල රූපය යි.

(18) පහතරට නර්තන සම්ප්‍රදායේ සරල කවි තාලයක් නර්තනය කිරීමෙන් පසු ඉදිරිපත් කරනු ලබන්නේ,
(1) සුරල ය. (2) කලාසම ය. (3) ඉලංගම ය. (4) ඉරට්ටිය ය.

(19) පත්තිනි දේවතාවිය අඹෙන් උපන් කථා පුවත නාට්‍යානුසාරයෙන් ගෙන හැර දක්වීම කරනු ලබන්නේ,
(1) අඹ විදමනේදී ය. (2) පත්තිනි පද නැටීමේදී ය.
(3) මී බන්ධනයේදී ය. (4) හළං වැඩම කරවීමේදී ය.

(20) දේශීය නර්තනය, ගායන හා සංස්කෘතිකාංග ඇතුළත් සෞන්දර්යාත්මක වටිනාකමකින් යුත් ඇසළ පෙරහැර නම්,
(1) ගංගාරාමයේ නවම් පෙරහැරයි (2) මහනුවර දළදා පෙරහැරයි
(3) කැළණියේ දුරුතු පෙරහැරයි (4) දෙවිනුවර මිහිඳු පෙරහැරයි

(ලකුණු 1 × 10 = 10)

## IV සබරගමු නැටුම්

(11) ''තෙයිතක තරිකිට ගතිගත තෙයියත් දොං'' මෙය,
(1) 11 වන දොඹින පදය වේ (2) 10 වන දොඹින පදය වේ
(3) 12 වන දොඹින පදය වේ (4) 9 වන දොඹින පදය වේ

(12) ''සොඳුරු සිරින් සුදු වෙඩුරෙන් බැති නා.....'' මෙම කවිය ගායනා කරන්නේ,
(1) මහ තනි තිතට ය. (2) සුළු මහ දෙතිතට ය.
(3) සුළු මැදුම් දෙතිතට ය. (4) මැදුම් තනි තිතට ය.

(13) මාත්‍රා 3+4 තාල රූපයට අයත් අඩව්වක කොටසක් වේ.
(1) තත් තරිගු තත් තකට... (2) ජිංත තකට දිරිකිට තරිකිට ගත...
(3) තදොම් මිත්තෙයි දොං දොමිත්තෙයි... (4) ජිංත ගත ගත ගතිත ගත ගත...

(14) ''හයියෙන් කීවොත් වන්නම ඔබිනට'' මෙම කවියේ ඉතිරි පද කොටස වනුයේ,
(1) විලසට දහස් ගණන් හැඬු...වේ. (2) අයියො මෙ වන්නම කියා දියන් මට...වේ.
(3) සක්වල වට තෙයිය තනත් තහනා...වේ. (4) අහස් කුසේ වැසි ගුවනින් එනවිට...වේ.

(15) සමන් දේවාලයේ දේවාභරණ වඩමවන අවස්ථාවේ දී මංගල දවුල් වාදනය වසර ගණනාවක් තුළ කර ඇති සබරගමු නර්තන ශිල්පියෙකි,
(1) ජී. වී. හීන්නිලමේ ගුරුතුමා (2) ජී. වී. පොඩි නිලමේ ගුරුතුමා
(3) පරංගියා වත්තේ පොඩි මහත්තයා ගුරුතුමා (4) පීටර් බුදනාවල ගුරුතුමා

(16) සබරගමු නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය හා ප්‍රධාන ඇඳුම් කට්ටලය නම්,
(1) දවුල - දෙවොල් ඇඳුම් කට්ටලය යි.
(2) තම්මැට්ටම - වෙස් ඇඳුම් කට්ටලය යි.
(3) දවුල - සමන් දෙවියන්ගේ පබළු ඇඳුම් කට්ටලය යි.
(4) ගැටබෙරය - තෙල්මේ පබළු ඇඳුම් කට්ටලය යි.

(17) 'ජිමිත් තත්කිට තකට ජිං තක' මෙම බෙර පදයට අයත් තාල රූපය වන්නේ,

(1) මාත්‍රා 2+3 දෙතිතේ තාල රූපයටයි (2) මාත්‍රා 3+4 දෙතිතේ තාල රූපයටයි

(3) මාත්‍රා 4+4 තනි තිතේ තාල රූපයටයි (4) මාත්‍රා 2+4 දෙතිතේ තාල රූපයටයි

(18) සබරගමු නර්තන සම්ප්‍රදායේ වන්නමක මාත්‍රා නර්තනය කිරීමෙන් පසු අනුපිළිවෙලින් ඉදිරිපත් කරනු ලබන්නේ,

(1) කලාසම හා තීරුමානම යන කොටස් වේ (2) කලාසම හා කස්තිරම යන කොටස් වේ

(3) කස්තිරම හා අඩව්ව යන කොටස් වේ (4) කලාසම හා අඩව්ව යන කොටස් වේ

(19) සබරගමු නර්තන සම්ප්‍රදායේ එන මුදුන් තාලය නර්තන අංගයේ සුවිශේෂිතාවය වන්නේ,

(1) වට්ටම්, අඩව් මුදුන් කිරීම යි (2) මාත්‍රා පද මුදුන් කිරීමයි

(3) කලාසම් මුදුන් කිරීම යි (4) කලාසම්, අඩව් මුදුන් කිරීමයි

(20) දේශීය නර්තන, ගායන හා සංස්කෘතිකාංග ඇතුලත් සෞන්දර්යාත්මක වටිනාකමින් යුත් ඇසළ පෙරහැර නම්,

(1) ගංගාරාමයේ නවම් පෙරහැරයි (2) මහනුවර දළදා පෙරහැරයි

(3) කැළණියේ දුරුතු පෙරහැරයි (4) දෙවිනුවර මිහිඳු පෙරහැරයි

(ලකුණු 1 × 10 = 10)

## II කොටස

සැලකිය යුතුයි:

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 03කට පමණක් පිළිතුරු සපයන්න.

(01) රූපවාහිනී නාලිකාවකින් විකාශනය වූ ඔබ නරඹන ලද නර්තන වැඩ සටහනක් ඇසුරින් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(i) විවිධ නර්තන අංග දැකිය හැකි රූපවාහිනී වැඩ සටහන් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) එක් වැඩ සටහනක දී ඔබ නරඹන ලද සාම්ප්‍රදායික නර්තන අංග දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(iii) එහිදී ඔබ දුටු වාදන අවස්ථා දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(iv) එක් නිර්මාණාත්මක නර්තන අංගයක් ගෙන එය ප්‍රාසාංගිකව ඉදිරිපත් කිරීම සඳහා රංග වස්ත්‍රාභරණ හා විදුලි ආලෝකයෙන් ලැබුණු පිටුවහල කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 04)

(02) (i) මාත්‍රා තුනේ තනි තිතට අයත් බෙර පදයක් ප්‍රස්ථාර කරන්න. (ලකුණු 02)

(ii) මාත්‍රා 2+3 දෙතිතට අයත් ප්‍රශස්තියක මුල් කවි පදය ප්‍රස්තාර කරන්න. (ලකුණු 04)

(iii) මාත්‍රා 3+4 දෙතිතට අයත් කස්තිරමක්/ඉරට්ටියක්/කලාසමක් ප්‍රස්තාර කරන්න. (ලකුණු 04)

(03) (i) දඹදෙණි යුගයේ නර්තන කලාව පිළිබඳ දක්වෙන සාහිත්‍ය කෘති 02ක් නම් කරන්න. (ලකුණු 02)

(ii) එම යුගයේ භාවිතා කරන ලද තූර්ය භාණ්ඩ අතුරින් අද දක්වා භාවිතයට ගන්නා භාණ්ඩ 02ක් නම් කරන්න. (ලකුණු 02)

(iii) යාපහුව යුගයේ නර්තන කලාව පැවැති බව දක්වෙන සාධකයක් නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 06)

(04) (i) ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායට අයත් ශාන්ති කර්මය නම් කර එහි එන චාරිත්‍ර විධි 02ක් ලියන්න. (ලකුණු 03)

(ii) එම ශාන්තිකර්මයේ ගායන සහිත ශාස්ත්‍රීය නර්තන අංගයක් සහ නාට්‍යමය අවස්ථා 02ක් නම් කරන්න. (ලකුණු 03)

(iii) එම ශාන්ති කර්මයට අයත් වූ පුරාවෘත්ත කථාව කෙටියෙන් ලියන්න. (ලකුණු 04)